# පරිසරය සුරැකීමේ කලාපීය වැඩ පිළිවෙල

එක්සත් ජාතීන්ගේ පරිසර වැඩ පිළිවෙලෙහි ආසියා හා ශාන්තිකර කලාපීය කාර්යාලයෙහි අනුග්‍රහය යටතේ (ශ්‍රී ලංකාවද ඇතුලු) කලාපීය ජනතාව විසින් සාමූහිකව පිහිටුවා ගන්නාලද දකුණු ආසියාකර සාමූහික පරිසර වැඩපිළිවෙල එම කලාපයේ සියලු දෙනාගේම ජීවිත කෙරෙහි බලපායි. එහි මූලික අංග මෙසේය:

(අ) පරිසර පාලනය — 1. පරිසරය රැකීම සඳහා ගතහැකි පියවර හා වැයවිය හැකි දෑ (මෙහිදී, විශාල වශයෙන් සංවර්ධන ව්‍යාපාර අරඹා ඇති ශ්‍රී ලංකාව අධ්‍යයනය සඳහා සුදුසු රටක් වශයෙන් පිළිගනු ඇත.) 2. පරිසර තත්ත්වයන් 3. නැවැත භාවිතා කළ හැකි සම්පත් පිළිබඳව පරිසරයට අදළවන තත්ත්ව ප්‍රමිතිය. 4. පරිසරයට අදළ නීති.

(ආ) ස්වාභාවික සම්පත් පාලනය— 1.ජල උල්පත් ඇතුලු පරිසරයට අදල රටාව සුරැකීම. 2. වන සංරක්ෂණය. 3, වන සත්ව හා අදළ සම්පත් සුරැකීම. 4. කොරල් ඇතුලු මුදු වෙරළ සුරැකීම. 5. දිවයින්හි මූලික පරිසර රටාව සුරැකීම සහ, 6. සංචාරක ව්‍යාපාරය හා පරිසරය.

(ඇ) සරු බිම නිසරුවීම — සෝද පාළුව, මුදු කැම ආදී හේතූන් නිසා, සරු පස නිසර වීමේ ප්‍රශ්නය.

(ඈ) කලාපීය මුදු සුරැකීම.

(ඉ) බල ශක්තිය හා පරිසරය — වත්මන් බල ශක්ති අර්බුදයට පිළියමක් වශයෙන් මෙන්ම අනාගත ආර්ථික හා පරිසර ස්ථාවරත්වයද සඳහා වැඩ පිළිවෙලක්.

(ඊ) අධ්‍යාපන හා පුහුණුව — ජීව ගෝල පරිසර දැනුම සමාජයීය වශයෙන් ප්‍රයෝජනවත් සංවර්ධන ක්‍රමෝපක්‍රම සඳහා යොමු කිරීම.

(උ) වන සත්ව පාලනය — මෙහිදී, වන සත්ව හා ජීව සම්පත් සුරැකීම ඇතුලු මිනිසා හා පරිසරයෙහි උන්නතිය උදෙසා ගත යුතු ක්‍රියා මාර්ග ගැන යෙදිය හැකි විධි විධාන පිළිබඳව කලාපීය රටවල් එක්ව සාකච්ඡාකොට පියවර ගනු ඇත.